
ඔබ සුවිශේෂ
කෙනෙක් !

# ඔබ සුවිශේෂ කෙනෙක්!

දිනක් මම සඟරාවක් බලමින් සිටිනවිට මම එක්තරා වැදගත් කියමනක් දුටුවා. එය මෙලෙස විය:

"සුවිශේෂ කෙනෙක් වීමට, සැම කෙනෙක්ම තවකෙනෙකුට විශේෂ කෙනෙක් විය යුතුය."



මම නැවති එය නැවතත් කියෙව්වෙමි.

"සුවිශේෂ කෙනෙක් වීමට, සැම කෙනෙක්ම, තවකෙනෙකුට, විශේෂ කෙනෙක් විය යුතුය."

කෙතරම් කුතුහලයක් ඇතිකරන කියමනක්ද ඒක!

මිනිස් බලය වෙනුවට විද්‍යාත්මක සොයාගැනීම් සහ නිර්මාණ යොදාගන්න මේ පරිඝනක යුගයේ, මිනිසාගේ නියම අගය හඳුනාගෙන නොමැත. පිරිමි සහ ස්ත්‍රීන් නිකම්ම නිකමෙක් - වැඩපොලක නොම්මරයක්, ජීවිතය නමැති යාන්ත්‍රණයේ එක දැත්තක්, මනුෂ්‍ය ජාතිය නමැති මහා සමුද්‍රයේ එක ජල බිඳක් පමණි. සමහරෙක් තම සුපිරි ශාරීරික හැකියාවන්, සංගීතමය නිර්මාණ, ක්‍රීඩා දක්ෂතා වැනි විශිෂ්ට ක්‍රියා යනාදීන් නිසා ලෝකයාට කැපී පෙනෙන බව ඇත්තයි; නමුත් අපට පාර තොටේ නිතරම මුණගැසෙන විශාල බහුතරය කිසිවෙකු නොහඳුනන, වටිනාකම නැති අය ලෙස අප පසුකර යයි.



ඇමෙරිකා එක්සත් ජනපදයේ නොර්ත් වෙස්ටන් විශ්වවිද්‍යාල වෛද්‍ය පාසලේ වෛද්‍ය ඩොනල්ඩ් ෆෝමන් මහතාට අනුව, මිනිස් සිරුරේ අඩංගු රසායනික ද්‍රව්‍යයන්ගේ වටිනාකම $ 3.50. වෙළඳ පරිහානිය තිබූ යුගයේ සාමාන්‍ය සිරුරක වූ රසායනික ද්‍රව්‍ය

අගය සත .90 පමණි. මිනිසා ලෝකයාට අනුව නිකම්ම නිකමෙක්. තරුණ මහලු සැම දෙනා පාහේ කොපමණ අවස්ථාවන්හි මහත් අසහනයකට පත්වෙනවද, තමන් ගන්න නොපසුබට වෑයම් සමාජය මගින් හඳුනා නොගන්න නිසා, ඔවුන්ගේ මත පිළි නොගන්න නිසා, ඔවුන්ට මෙලොව කිසිම මුද්‍රාවක් තැබීමට ඉඩ



නැති නිසා. ඔවුන් වැදගැම්මට නැති, නිකම්ම නිකමුන් මෙන්ය!

නැතිවූ බැටළුවෙක් පිලිබඳ යේසුස් වහන්සේ පැවසූ උපමාවක් බයිබලයේ සඳහන් වේ. ලූක් තුමාගේ සුවිශේෂයේ 15 වැනි පරිච්චේදයේ මෙය ලියවී ඇත. බැටළුවන් 100 ඇති එක්තරා එඬේරකු විය. නමුත් ඉන් එකෙක් නැතිවිය. ඔහු ඉතිරි 99 දමා නැතිවූ බැටළුව සොයා ගියා. යන මග කොතරම් අනතුරුදායක වුවත් ඒ නැතිවූ බැටළුව සොයා ගත යුතුමය. අවසානයේදී ඔහුට බැටළුවා  සම්බවුනා. අවසානයේදී, ඇත්තටම බැටළුවා සොයාගත්තා! ඔහු ඒ බැටළුවා උරහිස මත තබාගෙන තම නිවසට ගෙනැවිත්, අසල්වාසීන් කැඳවා ''මා සමඟ ප්‍රීතිවන්න. මන්ද නැතිවූ මගේ බැටළු පැටවා මට සම්බවුනා.'' යයි පැවසීය. එක බැටළුවකු පමණක් වුවත් එය ඒ එඬේරාට වැදගත් වුනා. යේසුස් වහන්සේ තවදුරටත් මෙසේ පැවසුවා:''මම යහපත් එඬේරා වෙමි;  යහපත් එඬේරා තම බැටළුවන් වෙනුවෙන් තම ජීවිතය පුදයි.''(යොහාන් 10:11)



ඔබ ඒ බැටළුවා මෙන් රැලෙන් සහ නිවසෙන් දුරස්වී යමින් සිටිනවා විය හැක. නමුත් යහපත් එඬේරාට ඔබ ඉතා වැදගත් පුද්ගලයෙක්ය. මුළු

ලෝකය ඒක්කොට ගත්තට වැඩිය ඔබ එතුමන්ට වටිනවාය, තම ජීවිතයටත් වඩා වටිනවාය. බයිබලයේ පවසනවා :”අපි ඒ බැටළුවා මෙන් රැලෙන් සහ නිවසෙන් දුරස්වී යමින් සිටිනවා විය හැක. නමුත් යහපත් එඬේරාට ඔබ ඉතා වැදගත් පුද්ගලයෙක්ය, “අපි පව්කරුවන්ව සිටිද්දීම ක්‍රිස්තුස් අප වෙනුවෙන් උකුත්වුව.” (රෝම 5:8). එතුමාණන් දිවස්වර යෙසාය මගින් කතාකොට : “මවකට හැකි ද, කුසේ දැරූ බිළිඳා අමතක කරන්න? හැකි ද ඇට ඇගේ ම කිරි දරුවාට පෙම් නොකරන්න? මවක ඇගේ දරුවා අමතක කළත්, මම නම්, කිසිදා නුඹ අමතක නොකරමි.” (යෙසාය 49:15). උන්වහන්සේ ඔබ ගැන සලකන සේක. ඔබගේ වර්තමාන තත්වය කුමක් වුවත් ඔබ උන්වහන්සේ ඉදිරියේ ඉතා අනර්ඝ කෙනෙක්ය. ඔබ සුවිශේෂ කෙනෙක්ය!



පාඨකය,

ඔබ මේ පත්‍රිකාව ඉවත දමන්නට පෙර මෙම සත්‍යතාවය සලකා බලන්න. ඔබ මිනිසා නොදකින, සමාජය විසින් නාඳුනන නිකමෙක් නොවේ. සමහරවිට ඔබට එසේ හැඟෙනවා ඇති - කිසිවෙකුට ඔබ ගැන තැකීමක් නැහැ, කිසිවෙක් ඔබව තේරුම් ගන්නේ නැහැ. නමුත් ඔබව තේරුම්ගන්න, හඳුනාගත් කෙනෙක් සිටිනවා. අපගේ ආශාව ඔබ ඒ පුද්ගලයා සමඟ සම්බන්ධ කරන්නයි. ඒ ස්වාමිවූ යේසුස් වහන්සේය. උන්වහන්සේට ඔබ වැදගත් කෙනෙක්ය. එතුමාණන්ට, ඔබ ගලවාගතයුතු වැදගත්කමක් ඇති කෙනෙක්. ජීවිතය පිදීමට පවා සුදුසු කෙනෙක්ය. එතුමන්



නෙත් ඉදිරියේ ඔබ ඉමහත් අතී අනර්ඝ වටිනාකමකින් යුත් කෙනෙක්ය. යේසුස් ඔබට ප්‍රේමකරනවා. ඔබ ගලවාගැනීමට උන්වහන්සේ තම දිවි පිදුවා; ඔබට සමාව දීමට, ඔබ සොයනා ඒ සාමය, ප්‍රීතිය සහ තෘප්තිය ඔබට ලබා දීමට උන්වහන්සේ ජීවත්ව සිටිනසේක.

ක්‍රිස්තුස් වහන්සේට හඬ ගසා උන්වහන්සේගේ දරුවකු වන්න.

සමහරවිට ඔබ සිතනවා ඇතී; ''මම දුර ගියා වැඩියි. මට කිසි බලාපොරොත්තුවක් නැහැ. මගේ අවකල්ක්‍රියා වලට මම වහලෙක්. මට උදව්

කරන්නට කිසිවෙකු නැහැ''. තරුණ, මහලු - ක්‍රිස්තුස් වහන්සේ තුලින් නැවුම් බලාපොරොත්තු, නව දිවියක්, සතුටක්, සාමයක්, අරමුණක්, ඉලක්කයක් තම දිවියට ඇතිකරගෙන ක්‍රිස්තුස් වහන්සේ තුල ජීවත්වීමෙ අගය සොයාගත්, එවැනි පුද්ගලයින් දසදහස් ගණනක් වෙති . මෙය ඔබටද අත්කරගත හැක, ඔබ යේසුස් ක්‍රිස්තුස් හට ඔබේ දිවිය කැපකළ විට. එය ඔබට අද සිදුවියහැක. මේ දැන්ම වුවත් !



## යාඥාව:

''ස්වාමිනි, මම පව්කාරයෙක්මි. කරුණාකර මාහට සමාව දෙන්න. මාහට මටම උදව් කරගත නොහැකි හෙයින්, මම සිටින ලෙසින් ඔබවෙතට එමි. මම විශ්වාස කරනවා ඔබ මට

ප්‍රේම කරන නිසා මා වෙනුවෙන් ඔබ දිවි පිදුවා කියා. මගේ අතීතයට පිටුපා මින් ඉදිරියට සෑම දිනකම ඔබවහන්සේ අනුව එන්න මට පිහිට වන්න. ඔබවහන්සේ මාගේ ගැලවුම්කරු සහ දෙවියන් වහ්සේ ලෙස මම පිලිගනිමි. මම මාගේ මුළු ජීවිතයම ඔබට දෙමි. යේසුස් වහන්සේගේ නාමයෙන්. ආමෙන්.”

